බාලයන් හට සිය පාසල් කාලය අනවශ්‍ය අතපෙවීම් සහ බාධාවන්ගෙන් තොරව සම්පූර්ණ කර ගැනීමට නිදහස තිබිය යුතු බව, යුනිසෙෆ් ඇතුළු ආයතන මගින් බාලවයස්කරුවන් පිළිබඳව වාර්තා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්ම පවසයි. එහිදී බාලවයස් දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළිකිරීම සම්බන්ධයෙන් ප්‍රවේසම් වීම ද අදාළ වේ.

"සිංහල අනූනවයෙන් බේරුනු 89 වත්ත" යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ (ඔක්. 16, 2022) පළ වී ඇති ලිපියක, එහි ජීවත් වන අයගේ ඡායාරූප පළ වී තිබේ. ඒ අතර කුඩා දරුවන්ගේ ඡායාරූප කිහිපයක් ද වේ.

1) මෙම දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළි කර තිබීම ගැටළුකාරී විය නොහැකි ද?

2) විශේෂයෙන්ම එය එම දරුවන්ගේ පාසල් අධ්‍යාපනයට බාධාවන් ගෙන දෙනු නොමැති යැයි අපට සහතික විය හැකිද?

බාලවයස් දරුවන්ට ඔවුන්ගේ පාසල් ජීවිතය බාධාවන්ගෙන් තොරව සම්පූර්ණ කරගැනීමට ඉඩ සලසමු!

මූලාශ්‍ර:
https://www.editorscode.org.uk/the_code.php
https://www.unicef.org/eca/media/ethical-guidelines

**අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!